# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**2119/9 – 2019 අප්‍රේල් 17 වැනි බදාදා – 2019.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳවල නමැති ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ආර්ටීඑම්/2017/615 හා 2018.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7279ක් පමණ වූ පහත නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කඳවල වත්ත, වරි. අංක 30 හා 34 පරණ ගුවන් තොටුපල පාර – ප්‍රමාණය: හෙක්. 0.7279**

උතුරට: පරණ ගුවන් තොටුපල පාර (ක.සි. 521001, කලාප 10, කැබලි අංක 188) සහ හිමිකම් කියන අය සහ වරි. අංකය නොදන්නා පරණ ගුවන් තොටුපල පාරේ ඉඩම (ක.සි. 521001, කලාප 10, කැබලි අංක 187); නැගෙනහිරට සහ දකුණට: ශ්‍රී ලංකා ගුවන් හමුදාව හිමිකම් කියන වරි. අංකය නොදන්නා ගාලු පාරේ කඳවලවත්ත නමැති ඉඩම (ක.සි. 521001, කලාප 4); බටහිරට: ශ්‍රී ලංකා ගුවන් හමුදාව හිමිකම් කියන වරි. අංකය නොදන්නා ගාලු පාරේ කඳවලවත්ත නමැති ඉඩම (ක.සි. 521001, කලාප 4) සහ ලංකා විදුලි බල මණ්ඩලය හිමිකම් කියන වරි. අංකය නොදන්නා පරණ ගුවන් තොටුපල පාරේ කඳවලවත්ත නමැති ඉඩම (ක.සි. 521001, කලාප 4, කැබලි අංක 190).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2017/ඩී/131.
2019 ජනවාරි මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 09